# මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදල - 2012

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.507,201ක් වූ ලබා නොගත් දිරිදීමනා ආපසු ලැබීම් සහ රු.280,416ක් වූ ලබා නොගත් දිරිදීමනා ආපසු ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි වෙන වෙනම දැක්වීම වෙනුවට එකිනෙකට හිලව් කර රු. 226,795ක් ලෙස දක්වා තිබුණි.

(ආ) පරිපාලන වියදම්, විශේෂ ඇගයීම් සහ ක්‍රීඩා කටයුතු සඳහා සත්‍ය වියදම රු.221,750ක් වුවද, රු. 920,995ක් ලෙස ගිණුම්වල දැක්වීම හේතුවෙන් වර්ෂයේ එම වියදම් රු. 699,245කින් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

1.2.2 අධිකාරී බලය නොලත් ගෙවීම්

(අ) 2011 ඔක්තොම්බර් 05 දිනැති අංක එල්.ඩී.බී. 24/51 අති විශේෂ ගැසට් පත්‍රයේ 3 වැනි නියෝගයේ (1) වැනි ඡේදයේ (ඉ) සහ (ඊ) අනුඡේදයන්හි සඳහන් වාර්ෂිකව අනුමත වියදම් ප්‍රමාණය ඉක්මවා රු.43,450ක් ගෙවීම් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | අනුමත ප්‍රමාණය | ගෙවීම් කල ප්‍රමාණය | අධිකාරී බලය නොලත් ගෙවීම් ප්‍රමාණය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කාර්ය මණ්ඩල ක්‍රීඩා විනෝද කටයුතු සහ සුහසාධන කටයුතු | 50,000 | 62,500 | 12,500 |
| ප්‍රශංසනාත්මක හා විශේෂ ඇගයීම් | 50,000 | 80,950 | 30,950 |
| | 100,000 | 143,450 | 43,450 |

(ආ) 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයේ 06 (ඇ) උපඡේදය පරිදි සියලුම දීමනා හා දිරි කාරක ගෙවීම් පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විමසා උපදෙස් නිකුත් කිරීම් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කිරීමකින් තොරව හා අනුමත කරන ලද අයවැය ලේඛණයකින් තොරව නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.128,146,204 ක් දිරිදීමනා ලෙස ගෙවා තිබුණි.

1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2001 ජුලි 10 දිනැති අංක 17/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | එකී චක්‍රලේඛණයේ විධිවිධාන වලට පටහැනිව වයස අවුරුදු 60 එළඹීමෙන් පසුව විශ්‍රාම ගිය නිලධාරිනියක් කොන්ත්‍රාත් පදනම මත 2012 දෙසැම්බර් මාසයේ සිට අරමුදලේ මූල්‍ය පාලක ලෙස පත්කිරීමට කටයුතු කර එම නිලධාරිනියට මාසිකව රු.35,000 බැගින් දීමනාවක් ගෙවීමට කටයුතු කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114 වගන්තිය | 2012 වර්ෂය තුල ගෙවීම් කළ රු.128,146,204ක දිරිදීමනා මුදලින් එක් එක් නිලධාරියාට අදාල දිරිදීමනා ප්‍රමාණය උපයන විට බදු ගෙවීම් ගණනය සඳහා අදාල කරගෙන නොතිබුණි. |
| (ඇ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.2 (ආ) ඡේදය | ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසු ඉතිරිවන අතිරික්ත මුදල් අප්‍රමාදව ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම හා අතිරික්ත අරමුදල් බාහිර ආයතනයන්හි ආයෝජනය කර ඇති විටෙක ඒවා කල්පිරුණු වහාම ඒකාබද්ධ අරමුදලට මාරු තළ යුතු වුවද, අරමුදල ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් අතිරික්තය රු.3,719,592 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.6,386,229 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,666,637ක අඩුවීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී දිරිදීමනා වියදම රු.4,850,171 ක් හෙවත් සියයට 8 කින් වැඩිවී තිබීම අතිරික්තය අඩුවීමට මූලිකව බලපා තිබුණි.

### 2.2 නිෂ්කාර්ය සම්පත්

අරමුදලේ රුපියල් මිලියන 46 කට ආසන්න අතිරික්ත මුදලක් භාණ්ඩාගාරයේ අතිරික්ත ගිණුමේ තැන්පත් කිරීමට කටයුතු නොකර මාසයකට වැඩි කාලයක් ජංගම ගිණුමක නිෂ්ක්‍රීයව පැවතුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතියක් ලබා ගැනීමකින් තොරව, මෝටර් වාහන සකස් කිරිම, නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, අලුතින් නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකරණය කිරීම හෝ නිර්මාණය වෙනස් කිරීමේ කටයුතු ඇතුළු මෝටර් වාහන සම්බන්ධයෙන් ඇතිවන විවිධ සාවද්‍ය ක්‍රියාකාරකම් අවම කර ගැනීම සහ එවැනි ක්‍රියාකාරකම්වල නියැලෙන පුද්ගලයින්ව අනාවරණය කිරීමත්, ඔවුනට විරුද්ධව නෛතික ක්‍රියාමාර්ග ගැනීමත් මෙම අරමුදල පිහිටුවීමේ මූලික අරමුණු වුවද, එවැනි කිසිදු ක්‍රියාකාරකමක් දෙපාර්තමේන්තුව විසින් සිදුකර නොතිබුණි. ඒ අනුව මෙම අරමුදල පිහිටුවීම තුලින් බලාපොරොත්තු වූ මූලික අරමුණු හා කාර්යභාරයන් දෙපාර්තමේන්තුව විසින් ඉටුකර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 ක්‍රියාකාරී සැලැස්ම

ත්‍යාග හා දිරිදීමනා අරමුදලට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි.

### 4.2 නොවිසඳී ඇති විගණන ඡේද

මෝටර් වාහන සම්බන්ධයෙන් විවිධ ආකාරයේ සාවද්‍ය ක්‍රියාවන් සිදුකරන ලද තැනැත්තන් සහ නිලධාරීන් පිළිබඳව මාගේ අංක SC/C/DMT/2010/03, SC/C/DMT/2010/04 හා TH/D/RMV/06 ඇතුලු විගණන විමසුම් රාශියක් මඟින්ම මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා වෙත පෙන්වා දී තිබුණද, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර මෝටර් රථ කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අයවැය

(ආ) ගිණුම්කරණය